# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
(බාහිර) - 2008

සමාජීය විද්‍යා පීඨය

ජාත්‍යන්තර අධ්‍යයනය - INTS -E2025

ජාත්‍යන්තර ආයතන

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි　　　　කාලය : පැය 03 යි

---

01. ලෝක සාමය හා ආරක්ෂාව සුරක්ෂිත කිරීම උදෙසා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආරක්ෂක මණ්ඩලය මගින් ඉටුවන කාර්යභාරය සාකච්ඡා කරන්න.

02. බලකඳවුරුවාදයේ බලපෑමෙන් මිදීම පිණිස පිහිටුවාගත් නොබැඳි සංවිධානයේ භූමිකාව හා අනාගත අභියෝග කවරේදැයි විමසන්න.

03. ලෝක වෙළඳ සංවිධානය (WTO) මගින් ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති පියවර සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි බලපාන ආකාරය විවේචනාත්මකව විමසන්න.

04. ඔපෙක් (OPEC) සංවිධානය සතු සුවිශේෂතා මොනවාදැයි ඇගයීමකට ලක් කරන්න.

05. ලෝක කම්කරු සංවිධානය (ILO) ලොව පුරා සේවය කරන කම්කරු ජනතාවගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද?

06. යුරෝපය පොදු ආර්ථික කලාපයක් බවට පත්කිරීම සඳහා යුරෝපා සංගමය විසින් ගෙන ඇති පියවර සහ එමගින් ශක්තිමත් යුරෝපයක් ගොඩනැංවීමට ලැබෙන පිටිවහල සාකච්ඡා කරන්න.

07. කලාපීය සහයෝගිතා සංවිධානයක් වශයෙන් සාර්ක් සංවිධානය මෙතෙක් ලබාගෙන ඇති ප්‍රගතිය අගයන්න.

08. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්හි පොදු ආර්ථික අභිලාෂ මුදුන්පත් කර ගැනීම උදෙසා G77 කණ්ඩායම මගින් ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි සාර්ථක අසාර්ථක බව විවේචනය කරන්න.

09. සාගින්න ලොවින් තුරන් කිරීම සඳහා ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවිධානය ගෙන ඇති පියවර කවරේද?

**************************